759.9548 SOM

# ක්‍රි. ව. දහඅටවැනි හා දහනවවැනි සියවස්වලදී ශ්‍රී ලංකාවේ බෞද්ධ විහාරාරාම ආශ්‍රිතව පැවති බිතුසිතුවම් කලාව පිළිබඳ ඓතිහාසික විමර්ශනයක්

එම්. සෝමතිලක

PERMANENT REFERENCE
FOR USE IN THE
LIBRARY ONLY

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රපති උපාධි
පරික්ෂණය සඳහා ඉදිරිපත් කරන
පර්යේෂණ නිබන්ධය

1996

568233

## ග්‍රන්ථ සාරය

ක්‍රි.ව. දහඅටවැනි හා දහනවවැනි සියවස් දෙකෙහිදී මෙරට බෞද්ධ විහාරාරාම ඇසුරුකොට ගෙන ප්‍රචලිතවුණු බිතුසිතුවම් සම්ප්‍රදාය ඊට පෙර ක්‍රි.ව. දොළොස්වැනි සියවස පමණ කාලයෙහිදී පැවති බෞද්ධ චිත්‍ර කලාවෙහි බලපෑමෙන් ප්‍රභවය වුණු එකක් බව පෙනෙන අතර ඊට පැරණි පෙතිකඩ චිත්‍ර කලාවෙහි හා පුස්කොළ පොත් කම්බ සැරසීමෙහි වැනි සියුම් කලාවන්හි බලපෑමක්ද ලැබී ඇති බව මෙහි පළමුවැනි පරිච්ඡේදයෙහිදී විස්තර කොට තිබේ. මහනුවර රාජධානි සමයෙහිදී සිටි පාලකයින් කිහිපදෙනෙකුගේම අනුග්‍රහය හොඳින් ලැබ, දිවයිනේ විවිධ ප්‍රදේශවලට ප්‍රචලිතවුණු මේ චිත්‍ර කලාව ප්‍රාදේශීයමය වශයෙන් සුළු වෙනස්කම් කිහිපයක්ද පළකළත් තාක්ෂණික පාර්ශ්වය හා නිර්මිත ක්‍රමවේදය වැනි සෑම අංශයකින්ම වාගේ ඒවා අතර තිබෙන සාම්‍යය නිසා මේවා ප්‍රාදේශීය විවිධත්වයක් නොව අඳින ලද කාලමය පරතරය නිසා ඇතිවුණු විවිධත්වයක් බව මෙහි දෙවැනි පරිච්ඡේදයෙහිදී විස්තරකොට තිබේ.

මේ සම්ප්‍රදායේ චිත්‍ර සහිත විහාර ගොඩනැංවීමෙහිදී මෙන්ම ඒවායෙහි බිත්ති හා වියන්තල වැනිදෑ සකස්කිරීමෙහිදී විශේෂවූ ක්‍රමවේදයක් අනුගමනයකොට ඇති අතර අවශ්‍ය වර්ණ සියල්ලම පාහේ දේශීය ඛනිජ හා උද්භිදමය ප්‍රභේදවලින් විවිධ ක්‍රම ගණනාවකටම අනුව සාදාගෙන ඇති බව පෙනේ. ඊට පෙර පැවති පැරණි ලාංකික සිතුවම් සම්ප්‍රදායන්ට වඩා මේවා මඳක් වෙනස් ක්‍රමවේදයකට අනුව ඇඳ ඇති බැවින් එය විශේෂවූ කලාවක් ලෙසටද සැලකිය හැකි බව මෙහි තෙවැනි පරිච්ඡේදයෙහිදී විස්තරයි. සිතුවම් සඳහා භාවිතාකොට තිබෙන තේමාවන් සියල්ලම පාහේ සෘජු ලෙසම බෞද්ධාගම සමඟ සබඳතාවයක් පෙන්වන අතර ඒවා ප්‍රතිරූපනය කරමින් අඳින ලද මානව, උද්භිද හා ගංගා ඇළදොළ වැනි රූප සටහන් නිමකොට තිබෙන ආකාරය, ඒවායෙහි පවත්නා කැපීපෙනෙන විශේෂ ලක්ෂණ වැනිදෑ ගැන මෙහි හතරවැනි පරිච්ඡේදයෙහිදී කරුණු විස්තරකොට තිබේ. මේ චිත්‍ර කලා සම්ප්‍රදාය ඩෙකාන්, දකුණු ඉන්දියානු, තායිලන්ත හා බුරුම වැනි විදේශීය චිත්‍ර කලා සම්ප්‍රදායයන් සමඟත්, සාංචි භාරුත් වැනි අතිපැරණි කැටයම් කලාවන් සමඟත් සම්බන්ධකොට දැක්වීමට ඇතැම් විචාරකයින් දරා ඇති උත්සාහයත්, මේවා අතර ඇතැම් සමානතාවයන් පැවතියත් එබඳු විදේශීය කලාවක් මහනුවර සම්ප්‍රදායේ චිත්‍රවල විකාශයට මිස එහි ප්‍රභවය කෙරෙහි බලපා නැති බවත් මෙහි පස්වැනි පරිච්ඡේදයෙහිදී විස්තර කෙරේ.

මේ අවධියෙහිදී සිටි කලා ශිල්පීන් කුල පදනමක් මත සේවය කරන ලද රජයේ විවිධ බැඳීම්වලටද හසුවුණු පිරිසක් ලෙසට සිටි නමුත් ඔවුන් සැලකියයුතු සමාජ තත්ත්වයක් දැරූ පිරිසක් බවද පෙනේ. මේ සිත්තරුනට ලැබුණු රාජ අනුග්‍රහය නිසා ඔවුනට ස්වාධීන ලෙස තම කටයුතු කරගෙන යාමට අසීරු තත්ත්වයක් තිබුණු නමුත් උපායශීලි ලෙස ඔවුන් නිදහස් මතධාරීන් ලෙස කටයුතු කළ බවද පෙනේ. මේ චිත්‍ර ඇඳීමෙහිදී ශිල්පීන් සමකාලීන සමාජ සංස්කෘතික පරිසරයද හොඳින් ප්‍රයෝජනයට ගෙන ඇති බැවින් ඒවා අද වන විට වැදගත් ප්‍රාථමික මූලාශ්‍ර වෙසෙසක් ලෙසට ඉතිහාසය හදාරණ තැනැත්තනට භාවිතාකළ හැකි බව මෙහි හයවැනි පරිච්ඡේදයෙහිදී විස්තර කොට තිබේ. මේ කරුණු හැරුණුවිට මේ ක්ෂේත්‍රය කෙරෙහි උනන්දුවක් දක්වන අනාගත පර්යේෂකයෙකුගේ අවධානය තවදුරටත් යොමුවියයුතු අංශයන් ගැනද මෙහි නිගමනයෙහි සඳහන්කර තිබේ.